අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 460

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිසුරුවරුන්/ මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**<u>අධිකරණයකින් වෙනත් අධිකරණයක් වෙත නිලධාරීන් තාවකාලික අනුයුක්ත කිරීම මත සංයුක්ත දීමනා හා ගමන් වියදම් ගෙවීම</u>**

උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) නිලධාරීන් යම් අධිකරණයක සිට වෙනත් අධිකරණයක් වෙත (ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව සංයුක්ත දීමනා හා ගමන් වියදම් සඳහා හිමිකම සහිතව) තාවකාලිකව අනුයුක්ත කර ඇති අවස්ථාවල දී අදාල නිලධාරීන්ට සංයුක්ත දීමනා හා ගමන් වියදම් දීමනා නොගෙවන බවට විවිධ අධිකරණවලින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.

02. ඒ පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කර ඇත.

(a) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඉහත 01 ඡේදයේ සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නිත්‍ය සේවා ස්ථානයෙන් බැහැරව වෙනත් සේවා ස්ථානයක් වෙත අනුයුක්ත කරනු ලබන්නේ පහත අවස්ථා යටතට ගැනෙන අත්‍යවශ්‍යයෙන් ඉටු කළ යුතු රාජකාරී අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින් බව

I. අධිකරණ වල නඩු විභාග කිරීමේ දී අවශ්‍ය වන භාෂා පරිවර්තක කටයුතු සඳහා සුදුසු භාෂණ පරිවර්තක නිලධාරීයෙකු එක් අධිකරණයක සිට වෙනත් අධිකරණයකට තාවකාලිකව අනුයුක්ත කිරීම.

II. උපලේඛනගත සේවයේ හෝ සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරිනියන් ප්‍රසූත නිවාඩු ලබා ගැනීමෙන් අධිකරණවල කටයුතු පවත්වා ගෙන යාමේ දී ඇතිවන දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා වෙනත් අධිකරණවලින් සුදුසු නිලධාරීන් තාවකාලිකව අනුයුක්ත කරනු ලැබීම.

III. අධිකරණ රෙජිස්ට්‍රාර් (තාක්ෂණ) සේවයේ නිලධාරීන් ඉතා සීමිත බැවින්, ඔවුන්ව අධිකරණවල අවශ්‍යතාව සහ අධිකරණ පරිගණකගත කිරීමේ (Court Automation) වැඩසටහන යටතේ නිතර වෙනත් අධිකරණවලට තාවකාලිකව අනුයුක්ත කරනු ලැබීම.

IV. සංවර්ධන නිලධාරී සේවයට අයත් ගිණුම් සහකාර නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු ලැබ වෙනත් අධිකරණයකට යාමෙන් පසු ඔවුන්ගේ රාජකාරී කටයුතු සඳහා වෙනත් නිලධාරියකු පුහුණු කරගන්නා තෙක් නැවත අනුයුක්ත කරන ලෙස ගණකාධිකාරීවරුන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බලා ඔවුන් තාවකාලිකව අනුයුක්ත කරනු ලැබීම.

V. වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබ වෙනත් අධිකරණවලට යන නඩු භාණ්ඩ භාරකරුවන් භාණ්ඩ භාර දීමේ කටයුතු අවසන් නොකළ අවස්ථාවන්හි දී අදාල අධිකරණවල විනිසුරුවන්ගේ ඉල්ලීම් මත එම නඩු භාණ්ඩ අනුප්‍රාප්තික භාණ්ඩ භාරකරුවන්ට භාර දීමේ කටයුතු අවසන් කරනු වස් ඔවුන් තාවකාලිකව අනුයුක්ත කරනු ලැබීම.

(b) රාජකාරී අවශ්‍යතාව මත නිලධාරීන් තාවකාලිකව වෙනත් සේවා ස්ථානයකට අනුයුක්ත කිරීම සිදු කරන විට එසේ අනුයුක්ත කර ඇති ස්ථානය අදාළ නිලධරයාගේ නිත්‍ය සේවා ස්ථානය ලෙස සැලකෙන බැවින් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 4.8 උප වගන්තියෙහි විධිවිධාන එකී නිලධරයන් සඳහා අදාල කරගත නොහැකි බව දන්වමින් සියලුම මහාධිකරණ විනිසුරුවරුන් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් අංක: MOJ/E10/ග.වි/2018 හා 2021.02.15 දිනැතිව ලිපියක් නිකුත් කර තිබුණි.

(c) ඒ පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව පහත සඳහන් කරුණු සඳහන් කරමින් "සේවා අවශ්‍යතාව මත යම් අධිකරණයකින් වෙනත් අධිකරණයක් වෙත අනුයුක්ත කරනු ලබන නිලධාරීන් හට ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන වලට යටත්ව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට බාධාවක් නොමැති බව අධිකරණ සේවා කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇති බවත් ඒ අනුව අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක: MOJ/E10/ග.වි/2018 හා 2021.02.15 දිනැති ලිපිය සංශෝධනය කිරිමට ඇති හැකියාව සලකා බලන ලෙසත්" අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන්වීමට තීරණය කරන ලදී.

(d) ඒ අනුව අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් අංක: MOJ/E10/ග.වි/පොදු/2021 හා 2022.05.31 දිනැතිව ලිපියක් එවන ලද අතර එම ලිපියේ 02 වන හා 04 වන ඡේදවල සඳහන් කරුණු, සියලුම උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ හා අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) නිලධාරීන්ගේ දැනගැනීම සඳහා පහත පරිදි උපුටා දක්වමි.

*"02. නිලධාරියෙකු රාජකාරී අවශ්‍යතාව අනුව නිත්‍ය සේවා ස්ථානයෙන් බැහැර සේවයේ යොදවා ඇති විට එවැනි අවස්ථාවකදී ප්‍රවාහන පහසුකම්, යැපීම් හා නවාතැන් පහසුකම් ආයතනය විසින් සපයා නොමැති නම් ආයතන සංග්‍රහයේ **XIV** පරිච්ඡේදයේ **4** වගන්තියේ විධානයන්ට අනුව සංයුක්ත දීමනා ලබා දීමට මගේ අංක **MOJ/E10/ග.වි/2018** හා **2021.02.15** හා දිනැති ලිපියේ සඳහන් කරුණු බාධාවක් නොවන අතර මාගේ ඉහත ලිපිය මගින් දන්වා ඇත්තේ නිලධාරීන් අඛණ්ඩව දීර්ඝ කාලයක් සඳහා රාජකාරී ස්ථානයෙන් පිටත සේවයේ යෙදවීමේදී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙනි.*

*04. එබැවින් අත්‍යාවශ්‍ය රාජකාරී සඳහා නිලධාරීන් වෙනත් අධිකරණයන්හි රාජකාරී සඳහා යෙදවීමේදී හැකිතාක් කෙටි කාලසීමාවක් සඳහා යෙදවීම සුදුසු බව නිර්දේශ කරන අතර සැලකිය යුතු දිගු කාල සීමාවක් සඳහා නිලධාරීන් එක් අධිකරණයකින් වෙනත් අධිකරණයක රාජකාරී සඳහා යෙදවීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා රජයට අමතර වැය බරක් සිදු නොවන පරිදි වැඩපිළිවෙලක් යොදා ගැනීම වඩාත් සුදුසු බව කාරුණිකව දන්වමි."*

03. ඉහත සඳහන් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ 2022.05.31 දිනැති ලිපියේ සඳහන් කරුණු සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, වෙනත් විකල්ප විසඳුමක් නොමැති අවස්ථාවන්හි දී හා සේවා අවශ්‍යතාව මත පමණක් පදනම්ව (එනම් අත්‍යාවශ්‍යම අවස්ථාවන්වල දී පමණක්) අනුයුක්ත කිරීම් සිදු කිරීමට තීරණය කර ඇත. ඒ අනුව එපරිද්දෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව අනුයුක්ත කිරීම් සිදු කළ විට එසේ අනුයුක්ත කරන නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට යටත්ව සංයුක්ත දීමනා හා ගමන් වියදම් සඳහා හිමිකම ඇති බව ඔබට දැන්වීමට තීරණය කර ඇත.

එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 දෙසැම්බර් මස 08 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.